**2025-05-26 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල
රැස්වීමේදී ගැනුණු තීරණ**

01. **පර්යේෂණ සහ සංවර්ධන වාණිජකරණ ජාතික ප්‍රවේශය වෙත ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා ඇගයීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කිරීම**

ශ්‍රී ලංකාව තුළ ආයෝජකයින් වෙනුවෙන් අවශ්‍ය පහසුකම් සැලසීම පිණිස දැනට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ වරාය නගර ආර්ථික කොමිෂන් ක්‍රියාත්මක වේ. එහෙත්, පර්යේෂණ හා සංවර්ධන වාණිජකරණයට අදාළ ව්‍යාපෘති හඳුනාගැනීම, ඒවායේ තාක්ෂණ හා ආර්ථික විභවතාව ඇගයීම සහ මිලනැන්වීම සඳහා කිසිදු පර්යේෂණ හා සංවර්ධන ආයෝජන ව්‍යාපෘති යෝජනාවක් විධිමත් පද්ධති ස්ථාපිතව නොමැති බව සැලකිල්ලට ගෙන, ජනාධිපති කාර්යාලය යටතේ "පර්යේෂණ සහ සංවර්ධන වාණිජකරණ ජාතික ප්‍රවේශය (NIRDC)" ස්ථාපිත කරනු ලැබ තිබේ. දැනටමත් පර්යේෂණ අවසන් කර ඇති හෝ ආසන්න වශයෙන් පර්යේෂණ නිම කිරීමට නියමිත ව්‍යාපෘති, අගය එකතු කළ අලෙවි කළ හැකි නිෂ්පාදන හෝ සේවාවන් ලෙස වෙළෙඳපොළට හඳුන්වා දීම සඳහා ඉදිරිපත් වන ආයෝජකයින්ට පහසුකම් සැලසීම එම ප්‍රවේශය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව, පර්යේෂණ සහ සංවර්ධන වාණිජකරණ ජාතික ප්‍රවේශය වෙත වාණිජකරණය සඳහා යොමු කෙරෙන ව්‍යාපෘති යෝජනා ඇගයීමට ලක් කර, සුදුසු ආයෝජකයින් වෙත යොමු කිරීම සඳහා තාක්ෂණ, අධ්‍යාපන, විද්‍යා, සෞඛ්‍ය, කෘෂිකර්ම, ආහාර හා තිරසාරතාවය, නගර සංවර්ධනය, යහපැවැත්ම හා අනෙකුත් ආංශික විශේෂඥ දැනුම සහිත විශේෂඥයින්ගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමතිය ලබා දෙන ලදී.

02. **ශ්‍රී ලංකාවේ ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීම සහ ඩිජිටල් ආර්ථික සංවර්ධනය සඳහා ආයතනික රාමුවක් ස්ථාපිත කිරීම**

2025-01-27 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී දැනට ක්‍රියාත්මකව පවතින ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) ඈවර කර, ඩිජිටල් ආර්ථික අධිකාරිය ස්ථාපිත කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කිරීම පිණිස අනුමැතිය ලබා දී ඇත. ඊට සමගාමීව ශ්‍රී ලංකාවේ ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීම සහ ඩිජිටල් ආර්ථික සංවර්ධනය සඳහා ආයතනික රාමුවක් ස්ථාපිත කිරීම පිණිස ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල දැනට පවතින ඩිජිටල් උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ අත්දැකීම් පිළිබඳව අධ්‍යයනය කරනු ලැබ තිබේ. ඒ අනුව, ජාතික



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை வாவி, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු. ඇ. T - (+94 11) 2515759
ෆැ. ෆැ. F - (+94 11) 2514753
වි. ත. E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

ඩිජිටල් උපායමාර්ගවලින් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ස්ථාවර සහ හොඳින් නිර්වචනය කරන ලද ආයතනික ව්‍යුහයක් පැවතීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. එම කරුණු සැලකිල්ලට ගෙන, දැනටමත් ආරම්භ කර ඇති සහ ඉදිරියේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇති ඩිජිටල් පරිවර්තන ව්‍යාපෘති බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි අවශ්‍ය බලතල සහිත ස්වාධීන ආයතනයක් වශයෙන් 'GovTech (Pvt) Limited' නමින් රජය සතු සමාගමක් ස්ථාපිත කිරීම පිණිස ඩිජිටල් ආර්ථික අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ කොටස් අයිතිය බැහැර කිරීම

2011 වසරේ දෙසැම්බර් මාසයේදී සංචාරක/ආගන්තුක සත්කාරක ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීම සඳහා කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම ස්ථාපනය කරනු ලැබ ඇත. එම සමාගමේ ආයෝජනයක් වන 'ග්‍රෑන්ඩ් හයිට්, කොළඹ' ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස සිනෝලංකා හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම ස්ථාපිත කර තිබේ. 'රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ වැඩසටහන' යටතේ කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ කොටස් අයිතිය බැහැර කිරීම සඳහාත්, එකී කාර්යය සඳහා ගනුදෙනු උපදේශක වශයෙන් ඉන්දියාවේ ඩෙලොයිට් ටච් හමත්සු එල්එල්පී සමාගම තෝරා ගැනීම සඳහාත් එවකට පැවති අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. එහෙත්, ඒ අනුව ඉදිරි පියවර ගෙන නොමැත. 'ග්‍රෑන්ඩ් හයිට්, කොළඹ' ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම සඳහා තවදුරටත් ඇමෙරිකානු ඩොලර් මිලියන 120ක් පමණ (රුපියල් බිලියන 36ක් පමණ) අවශ්‍ය වනු ඇතැයි මේ වන විට ඇස්තමේන්තු කර තිබේ. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සඳහා තවදුරටත් අවශ්‍ය අරමුදල් එම සමාගමේ කොටස් හිමියන්ගෙන් හෝ ණය මූල්‍යකරණය හරහා හෝ ලබා ගැනීමට පවතින අපහසුතාව සැලකිල්ලට ගෙන, සමාගමේ කොටස් විකිණීමේ ක්‍රියාවලියක් හරහා අවශ්‍ය අරමුදල් සලසා ගෙන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කර, වාණිජමය මෙහෙයුම් ආරම්භ කිරීම වඩාත් යෝග්‍ය විකල්පය වශයෙන් හඳුනාගෙන ඇත. ඒ අනුව, කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ කොටස් අයිතිය බැහැර කිරීමේ ක්‍රියාවලිය නැවත ආරම්භ කිරීමටත්, ඒ සඳහා තවදුරටත් ගනුදෙනු උපදේශක ලෙස ඉන්දියාවේ ඩෙලොයිට් ටච් හමත්සු එල්එල්පී සමාගමේ සේවය ලබා ගැනීමටත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. "සමුද්‍රීය මාර්ගයේ රාත්‍රී යාමය: නොනිදන කොළඹ" ව්‍යාපෘතිය

රාත්‍රී කාලයේ සංචාරක ක්‍රියාකාරකම් වැඩි කිරීම හරහා දේශීය ආර්ථිකය ඉහළ නැංවීම, සංචාරක කර්මාන්තය නංවාලීම සහ කොළඹ නගරයේදී අත්විඳිය හැකි සංචාරක අත්දැකීම් වැඩි කිරීම සඳහා ව්‍යුහගත ප්‍රවේශයක අවශ්‍යතාව හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, "සමුද්‍රීය මාර්ගයේ රාත්‍රී යාමය: නොනිදන කොළඹ" (Marine Nights: Awakening Colombo) තේමාව යටතේ කොල්ලුපිටිය දුම්රිය ස්ථානයේ සිට දෙහිවල දක්වා කිලෝමීටර 7.4ක් පමණ වන කොළඹ සමුද්‍රීය මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. එහිදී ගාලු මුවදොර කෙළවර සිට ශාන්ත තෝමස් ප්‍රාථමික පාසල දක්වා මීටර 400ක් පමණ වන කලාපය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණය කිරීම පිණිස සීමිත වගකීම් සමාගමක් සංස්ථාගත කිරීම

ගොවිපොළ හෝ කෘෂිකාර්මික නිෂ්පාදන විකිණීම, මිල දී ගැනීම, ගබඩා කිරීම සහ බෙදා හැරීම සඳහා අවශ්‍ය වෙළෙඳපොළ යටිතල පහසුකම් සැපයීම පිණිස විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන 18ක් මේ වන විට ස්ථාපිත කර ඇත. ඒ අතුරින් වවුනියාව, කිලිනොච්චිය, යාපනය සහ මඩකලපුව හැර අනෙකුත් ආර්ථික මධ්‍යස්ථාන 14 දැනට ක්‍රියාත්මකව පවතී. එම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණය 2006-01-10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිගේ ප්‍රධානත්වයෙන් රාජ්‍ය ආයතන සහ වෙළෙඳ සංගම්වල නිල බලයෙන් පත් වන සාමාජිකයින්ගෙන් සමන්විත කළමනාකරණ භාරයක් මඟින් සිදු කරනු ලබයි. මෙම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල ව්‍යාපාරික ක්‍රියාකාරකම් සාර්ථක ව සහ තිරසර ව සිදු කිරීම සඳහා මධ්‍යගත, නෛතික ව පිළිගත හැකි සහ වගවීම සහිත ආයතනික සැකැස්මක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම, පුළුල් කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා සීමිත වගකීම් සමාගමක් ස්ථාපිත කිරීම පිණිස වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. ළමා අපයෝජන සිද්ධීන් අවම කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් යුත් බහු-ආංශික යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම

2025-03-03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දෙන ලද නව රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි ' සුරක්ෂිත ළමා ලෝකයක් - නිර්මාණශීලී අනාගත සරපුරක් ' යන ප්‍රතිපත්තිමය බැඳියාවෙහි ප්‍රධාන මූලධර්මයක් වශයෙන් දරුවන්ට සිදුවන අපයෝජන සහ සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ගෙන් දරුවන් ආරක්ෂා කිරීම හඳුනාගනු ලැබ ඇත. දරුවන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් විවිධ අයුරින් මැදිහත් වන පාර්ශ්වයන් කිහිපයක් රාජ්‍ය යාන්ත්‍රණය තුළ දැනට ක්‍රියාත්මක වේ. ඒ අතුරින් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පොලීසිය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි. දරුවන්ට සිදු වන අපයෝජන සහ සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් පිළිබඳව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් පැය 24 පුරාම පැමිණිලි භාර ගැනීමේ පහසුකම් සලසා ඇත. එසේ වුවද, විධිමත් අයුරින් පැමිණිලි ඉදිරිපත් නොවන අවස්ථාවන් ද බහුල වශයෙන් පවතින බව පෙනී ගොස් තිබේ. එවැනි අවස්ථාවලදී කඩිනමින් මැදිහත්ව කටයුතු කිරීමට හැකි වන පරිදි පහත සඳහන් පියවර ගැනීම පිණිස කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතිත්වය යටතේ අදාළ අනෙකුත් ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත ස්ථාවර ජාතික කමිටුවක් පත් කිරීම.

* දරුවන්ට එරෙහි කායික දණ්ඩනය තුරන් කිරීමට හැකි වන පරිදි දණ්ඩ නීති සංග්‍රහය සහ අපරාධ නඩු විධාන සංග්‍රහයට කඩිනමින් සංශෝධන හඳුන්වා දීම.

* දරුවන්ට සිදු වන අපයෝජන සහ සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් පිළිබඳව වාර්තාකරණයේදී වින්දිත දරුවන් නැවත නැවත වින්දිතයන් බවට පත් වීම වැළැක්වීමට හැකි වන පරිදි යෝග්‍ය විධිවිධාන ඇතුළත් කරමින්, දැනට කෙටුම්පත් කෙරෙමින් පවතින මාධ්‍ය ආචාරධර්ම පද්ධතිය කඩිනමින් ප්‍රකාශයට පත් කිරීම.

**08. ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ් මඟින් යූරියා මෙට්‍රික්ටොන් 15,000ක් ප්‍රසම්පාදනය කිරීම**

ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ් විසින් පෞද්ගලික අංශයේ සමාගම් හා තරගකාරී අයුරින් 2023/24 මහ කන්නයේ සිට පොහොර ආනයනය කර ගොවීන් වෙත අලෙවි කිරීම සඳහා 2023-07-17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ඉදිරි කන්නය සඳහා විවෘත වෙළෙඳපොළ තුළ සෘජු හා මිශ්‍ර පොහොර ලෙස අලෙවි කිරීම පිණිස ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුගමනය කරමින්, යූරියා මෙට්‍රික්ටොන් 15,000ක් ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ් විසින් ආනයනය කිරීම සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**09. කිරි ගොවීන් සංවිධානගත කර බලගැන්වීම මඟින් ඔවුන්ගේ නිෂ්පාදන ඵලදායිතාව ඉහළ නැංවීම සහ කිරි අගයදාමය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

ලෝක බැංකුව විසින් මූල්‍යනය කරනු ලබන අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කෘෂිකර්ම අංශය දියුණු කිරීම සඳහා වෙන් කර ඇති ඇමෙරිකානු ඩොලර් මිලියන 10ක අරමුදල් උපයෝජනය කරමින් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය විසින් "කිරි ගොවිපොළ ඵලදායිතාව ඉහළ නංවා කිරි අගයදාම සංවර්ධනය කිරීමේ" ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත. ඒ සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලැබී තිබේ. කිරි නිෂ්පාදනය සඳහා විභවතාවයක් පවතින අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, පුත්තලම,මාතලේ, මහනුවර, නුවරඑළිය, ගම්පහ, අම්පාර, බදුල්ල, ගාල්ල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක 12ක යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව, එම දිස්ත්‍රික්ක තුළ කිරි ගොවිපොළ ඵලදායිතාව ඉහළ නංවා කිරි අගයදාම සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**10. 2025-09-01 දින සිට 2025-12-31 දින දක්වා කාලය තුළ මර්බන් වර්ගයේ බොර තෙල් නැව් තොග 04ක් මිල දී ගැනීම වෙනුවෙන් වූ දිගුකාලීන ප්‍රසම්පාදනය පිරිනැමීම**

2025-09-01 දින සිට 2025-12-31 දින දක්වා කාලය තුළ මර්බන් වර්ගයේ බොර තෙල් නැව් තොග 04ක් මිල දී ගැනීම පිණිස ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 07ක් ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව සිංගප්පූරුවේ BB Energy Asia Pte. Ltd

වෙත අදාළ ප්‍රසම්පාදනය පිරිනැමීම පිණිස බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**11. විදේශ ත්‍රස්තවාදී සටන්කරුවන්ට එරෙහිව කටයුතු කිරීම සඳහා ඵලදායී නීතිමය රාමුවක් හඳුන්වා දීම**

ශ්‍රී ලංකාව මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා-පැසිෆික් කලාපයේ සාමාජිකයෙකු වශයෙන් මූල්‍ය ක්‍රියාකාරී කාර්යසාධක බලකාය විසින් සකස් කරන ලද මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ ව්‍යාප්ත මූල්‍යකරණයට එරෙහි ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට සහ බලාත්මක කිරීමට කැප වී සිටී. තව ද, එකී සාමාජිකත්ව නීතිවලට අනුකූලව මූල්‍ය ක්‍රියාකාරී කාර්යසාධක බලකායේ ප්‍රමිතීන්ට අනුකූල වීමේ මට්ටම තීරණය කිරීම සඳහා සෑම වසර 06කට වරක් "අන්‍යෝන්‍ය ඇගයීම" නමින් හැඳින්වෙන අන්‍යෝන්‍ය සම සමාලෝචන ක්‍රියාවලියකට ශ්‍රී ලංකාව යටත් වේ. ශ්‍රී ලංකාවට අදාළ 3වන ඇගයීම සඳහා සකස් කරනු ලැබ ඇති ක්‍රියාකාරී සැලැස්ම අනුව, විදේශ කටයුතු විෂයභාර අමාත්‍යාංශය සහ ආරක්ෂක අමාත්‍යාංශය විසින් විදේශීය ත්‍රස්තවාදී සටන්කරුවන් සම්බන්ධයෙන් වන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාව 2178(2014) කඩිනමින් ප්‍රකාශයට පත් කිරීමට සහ දේශීය නීති සම්පාදනය මඟින් එම යෝජනාවේ විධිවිධාන බලාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. ඒ අනුව, 2026 මාර්තු මාසයට පෙර විදේශීය ත්‍රස්තවාදී සටන්කරුවන් පිළිබඳ නීති සම්පාදනය කිරීමට ශ්‍රී ලංකාව බැඳී සිටී. එබැවින්, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාව 2178(2014) පදනම් කරගෙන විදේශීය ත්‍රස්තවාදී සටන්කරුවන්ට එරෙහිව කටයුතු කිරීම පිණිස නීති කෙටුම්පත් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා සහ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**12. 2018 අංක 2 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත යටතේ සකස් කරන ලද නියෝග පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම**

විදේශ රටවලින් ආනයනික භාණ්ඩ මෙන් ම සහනාධාර ලබා දෙන භාණ්ඩ ප්‍රපාතනය කිරීමෙන් දේශීය කර්මාන්ත සහ ව්‍යවසායකයන් ආරක්ෂා කිරීම සඳහා 2018 අංක 2 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනතේ විධිවිධාන පරිදි '2025 ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු නියෝග පැනවීම පිළිබඳ විමර්ශනයක් ආරම්භ කිරීම සඳහා අයදුම්පත්‍රය' සහ '2025 මිල පොරොන්දු නියෝග සඳහා පටිපාටිය' පිළිබඳ නියෝග ප්‍රකාශයට පත් කිරීම සඳහා 2025.03.03 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, එකී පනතේ විධිවිධාන යටතේ සාදන ලද සහ අංක 2429/32 දරන 2025-03-27 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය

මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති '2025 ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පැනවීම සඳහා විමර්ශනයක් ආරම්භ කිරීමට ඉල්ලුම් කිරීමේ නියෝග' අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පනත යටතේ සාදන ලද නියමය පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම**

වෙනත් රටවල නඩු තීන්දු ශ්‍රී ලංකාව තුළ පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා 2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පනත මඟින් විධිවිධාන සලසා ඇත. ඒ අනුව, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා විසින් අදාළ පනතේ විධිවිධාන ප්‍රකාර ව සාදන ලදුව, අංක 2429/51 දරන 2025-03-28 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති නියමයක් මඟින් එබඳු නඩු තීන්දු පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම අදාළ කරගත යුතු විදේශ රටවල් නිශ්චිත ව දක්වා ඇත. එකී නියමය පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම පිණිස අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. **2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ සාදන ලද නියෝග පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ ප්‍රතිපාදන අනුව පිහිටුවා ඇති අතර ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ප්‍රමිතීන් යටතේ ක්‍රියාත්මක වේ. එම ආයතනයේ අනිවාර්ය ජාත්‍යන්තර ප්‍රමිතියක් වන තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව අදාළ සම්මුතිගත රටවල් විසින් සිය රට තුළ යාවත්කාලීන කරමින් බලාත්මක කළ යුතු වේ. ඒ අනුව, 2025 වර්ෂයට අදාළ ව ක්‍රීඩකයන්ට මෙන් ම අශ්ව සහ තුරඟ තරග සඳහා වන තහනම් ද්‍රව්‍ය ප්‍රකාශයට පත් කරමින් 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ විධිවිධාන ප්‍රකාරව සාදන ලද සහ අංක 2430/24 දරන 2025-04-03 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලද 2024 අංක 10 දරන තහනම් උත්තේජක (තහනම් කරන ලද ලැයිස්තුව) නියෝග පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීම පිණිස තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

15. **කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කිරීම**

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි සේවය කරන ලද ආචාර්ය ඊ.ආර්.එස්.පී.එදිරිමාන්න මහත්මිය 2025-05-18 දින සේවයෙන් විශ්‍රාම ගොස් ඇත. ඒ අනුව පුරප්පාඩු වී ඇති කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා දැනට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ අතිරේක ලේකම් තනතුරක සේවය කරනු ලබන ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී ආචාර්ය ඩබ්ලිව්.ඒ.ආර්.ටී.වික්‍රමආරච්චි මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි පත් කිරීම පිණිස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

16. **රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩල කළමනාකරණය සඳහා පත් කරනු ලැබ ඇති කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම**

රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩල කළමනාකරණය සඳහා අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුතුව පත් කර ඇති නිලධාරී කමිටුව විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවන් දෙකක් (02) මඟින් රේඛීය අමාත්‍යාංශ 18ක, පළාත් සභා 04ක සහ විශේෂ වියදම් ඒකක 02ක තනතුරු පුරප්පාඩු 15,073ක් සඳහා බඳවා ගැනීම නිර්දේශ කර ඇත. ඒ අනුව, එම වාර්තා මඟින් නිර්දේශිත බඳවාගැනීම් සිදු කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.

17. **ශ්‍රී ලංකාව සහ චීනය අතර සුමට ද්විපාර්ශ්වික වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරී කණ්ඩායමක් ස්ථාපිත කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීම**

ශ්‍රී ලංකාව සහ චීනය අතර සුමට ද්විපාර්ශ්වික වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරී කණ්ඩායමක් ස්ථාපිත කිරීමට යෝජනා වී තිබේ. එමඟින්, ද්විපාර්ශ්වික වෙළෙඳාමේ ප්‍රයෝජනයට නොගත් විභවයන් විවෘත කිරීම, වෙළෙඳාම ආශ්‍රිත අභියෝගවලට මුහුණ දීම සහ ශ්‍රී ලංකාව සහ චීනය අතර වෙළෙඳාමේ පරිමාව ඉහළ නැංවීම හා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම අරමුණු කර තිබේ. ඒ අනුව, යෝජිත පරිදි ක්‍රියාකාරී කණ්ඩායම ස්ථාපිත කිරීම සඳහා මහජන චීන සමූහාණ්ඩුවේ වාණිජ අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකාවේ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීම පිණිස වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

18. **2025-06-01 දින සිට 2025-11-30 දින දක්වා කාලය තුළ ඩීසල් (0.05% M.S.) නැව් තොග 05ක් මිල දී ගැනීම වෙනුවෙන් වූ දිගුකාලීන කොන්ත්‍රාත්තුව**

2025-06-01 දින සිට 2025-11-30 දින දක්වා කාලය තුළ ඩීසල් (0.05% M.S.) නැව් තොග 05ක් මිල දී ගැනීම පිණිස ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ලියාපදිංචි සැපයුම්කරුවන් වෙතින් ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 07ක් ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව සිංගප්පූරුවේ M/s Trafigura Pte. Ltd., වෙත අදාළ ප්‍රසම්පාදනය පිරිනැමීම පිණිස බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

19. **කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය හා මහජන චීන සමූහාණ්ඩුවේ වාණිජ අමාත්‍යාංශය අතර කාර්මික සැපයුම්දාමවල ආර්ථික සහයෝගිතාව ශක්තිමත් කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම**

පොදු සංවර්ධනය, ආර්ථික වර්ධනය සහ රැකියා අවස්ථා ආදී අන්‍යෝන්‍ය ප්‍රතිලාභ අත්කර ගැනීමේ අරමුණින් කාර්මික හා සැපයුම්දාමවල ව්‍යවසායකයන් අතර සහයෝගිතාව ශක්තිමත් කිරීමට සහ පහසුකම් සැලසීමට ශ්‍රී ලංකාව සහ මහජන චීන සමූහාණ්ඩුව අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට යෝජනා වී ඇත. ඒ අනුව, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය සහ මහජන චීන සමූහාණ්ඩුවේ වාණිජ අමාත්‍යාංශය අතර යෝජිත අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම පිණිස කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

20. **2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම**

2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම පිණිස 2025-02-09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා; මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා; සහ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සටහන සැලකිල්ලට ගනිමින්, දැනට හඳුනාගනු ලැබ ඇති සංශෝධන සහ මහජන අදහස් විමසීමෙන් අනතුරුව හඳුනාගනු ලබන සංශෝධන ඇතුළත් කරමින් එකී පනත සංශෝධනය කිරීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ ගරු විනිශ්චයකාරවරයෙකුගේ සභාපතිත්වය යටතේ අදාළ සියලු අංශ නියෝජනය කරමින් කමිටුවක් පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දෙන ලදී.

21. ආදායම් පරිපාලන ප්‍රතිසංස්කරණ හා නවීකරණ කාර්යාංශය ස්ථාපිත කිරීම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම් රැස් කිරීමේ යාන්ත්‍රණයේ ප්‍රධානතම වගකීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව යන ආයතන ත්‍රිත්වය මඟින් දරනු ලබයි. වර්තමානයේ එම දෙපාර්තමේන්තු, ඒකාබද්ධ නොවන මෙහෙයුම් ක්‍රියාවලියක් පැවතීම, යාවත්කාලීන නොවූ ක්‍රියාවලීන් හා නීති පද්ධතීන් හේතුවෙන් ඇති වන අකාර්යක්ෂමතාවන්, ආදායම් නිසි පරිදි අය නොවීම, ඩිජිටල්කරණය සඳහා ඇති නැඹුරුව ප්‍රමාණවත් නොවීම, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී අන්තර් ආයතනික සම්බන්ධීකරණය ප්‍රමාණවත් නොවීම සහ සුපිළිපන්නභාවය පිළිබඳ ගැටලු යන අභියෝගවලට මුහුණ දෙමින් පවතී. 'පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් සාර්ව ආර්ථික ස්ථායීකරණ ක්‍රියාමාර්ග යටතේ ජාත්‍යන්තර ගනුදෙනු සම්බන්ධයෙන් කටයුතු කිරීමට විශේෂ අංශයක් ද සහිතව බදු ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා නව ඒකකයක් හඳුන්වා දීමට යෝජනා කර ඇත. ඒ අනුව, දැනට පවතින අභියෝග ජය ගැනීම තුළින් රාජ්‍ය ආදායම් පරිපාලන යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතයන් සමඟ අනුගත වෙමින් 'ආදායම් පරිපාලන ප්‍රතිසංස්කරණ හා නවීකරණ කාර්යාංශය' යන නමින් විශේෂ කාර්යාංශයක් ජනාධිපති කාර්යාලය යටතේ පිහිටුවීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**********